&× ´ {ÆæÈ à`ÑÍ ó
All Rights Reserved

# මධ්‍ය වාර පරීක්ෂණය 2015

**4 ශ්‍රේණිය** | **සිංහල** | **කාලය පැය 1 යි. වි. 30 යි.**

| නම/ විභාග අංකය: |
|---|

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

01 පහත වූ ඡේදය කියවා අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

මැලේසියාව නිජබිම කරගත් රඹුටන් සිසුන් අතර ජනප්‍රිය පලතුරකි. ශ්‍රී ලංකාවේ මල්වාන ප්‍රදේශය රඹුටන් වගාව සඳහා ප්‍රසිද්ධය. පැළ සිටුවා වසර හතරක් හෝ පහක් පමණ කාලයක් ගතවීමෙන් පසු ගෙඩි හටගන්නා රඹුටන් ඉදුණු පසු රතු සහ කහ පාටින් යුතු වේ. රඹුටන් ගෙඩි ඉදෙන විට එන ලේනුන්ගෙන් හා කුරුල්ලන්ගෙන් ආරක්ෂා කර ගැනීමට මහත් වෙහෙසක් දැරීමට සිදුවේ.

(1) රඹුටන් ගසේ නිජබිම කුමක් ද?

..........................................................................................

(2) ශ්‍රී ලංකාවේ රඹුටන් වලට ප්‍රසිද්ධ ප්‍රදේශය කුමක් ද?

..........................................................................................

(3) ඉදුණු රඹුටන් කුමන පාටද?

..........................................................................................

(4) රඹුටන් සිටුවා ගෙඩි හටගැනීමට කොපමණ කාලයක් ගතවේ ද?

..........................................................................................

(5) ඉදුණු රඹුටන් කෑමට එන සතුන් කවුද?

.......................................... ..........................................

(6) සමාන පද ලියන්න.

සිසුන් - .......................................... පැහැය - ..........................................

(7) විරුද්ධ පද ලියන්න.

ප්‍රසිද්ධ - .......................................... ඉදුණු - ..........................................

(8) ඒක වචන පද ලියන්න.

ගෙඩි - ........................................ ලේනුන් - ........................................

(9) මෙහි සඳහන් ස්ථාන නාම පද 2 ලියන්න.

........................................ ........................................

(10) කුරුල්ලන් යන පදයේ ස්ත්‍රී ලිංග පදය ලියන්න.

........................................

(2 x 15 = 30)

02 නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචනය යටින් ඉරක් අඳින්න.

(1) කුමිනාශක කෘමිනාශක කෘමිනාෂක

(2) තෘණ විශේෂ තුණ විශේෂ තෘණ විෂේෂ

(3) වුක්ෂලතා වෘක්ශලතා වෘක්ෂලතා

(4) ක්‍රමක්‍රමයෙන් ක්‍රමක්‍රමයෙන් කමක්කමයෙන්

(5) පිළිබිඹුව පිලිබිබුව පිළිබිබුව (1 x 5 = 05)

03 උත්තර ලියන්න.

(1) පහත වගන්තිවලට සුදුසු විරාම ලකුණු යොදන්න.

1. අනේ මේ තියෙන්නේ මගේ මුදල් පසුම්බිය

2. මා මළා නැගිටින්නේ කෙසේ ද

(2) ලියන බසට හරවා ලියන්න.

1. තරු රාත්‍රී අහසේ බබලනවා

........................................

2. කුරුල්ලෝ මිහිරි ගීත ගයනවා

........................................

(3) වචන ගලපා අර්ථවත් වැකියක් සාදන්න.

1. විශාලම / සිංහරාජයයි / ශ්‍රී ලංකාවේ / වනාන්තරය

........................................

2. ගියාය / නෙළාගෙන / පන්සල් / උපාසිකාව / මල්

........................................

(4) අතීත කාල ක්‍රියා පද යොදන්න.

1. අපි වෙසක් කූඩු ..............................

2. ගෙවිලියෝ වෙලට ඇඹුල ගෙන ..............................

(5) තේරවිලි විසඳන්න.

1. වක්ක වකයි වක දෙවකයි

වත්තෙම පොල් ඔක්කො කයි

..............................

2. පේන කෙනාට ඕන්නෑ - ඕන කෙනාට පේන්නෑ

..............................

(6) පහත වචන කෙටිකර ලියන්න.

1. මධ්‍ය මහා විද්‍යාලය ..............................

2. ලංකා විදුලිබල මණ්ඩලය ..............................

(7) දී ඇති වචනවලට තනි පද ලියන්න.

1. ජලයෙන් වටවූ කුඩා ගොඩබිම ..............................

2. පාද 4 ක් ඇති සතුන් ..............................

(8) සුදුසු උක්ත පද යොදන්න.

1. .............................................. තණ කොළ කෑවාය.

2. .............................................. වේගයෙන් දිව්වේ ය.

(9) පහත දී ඇති උපකරණ භාවිතා කරන වෘත්තීන් මොනවාදැයි ලියන්න.

1. අතකොළුව ..............................

2. අතංගුව ..............................

(10) හිස්තැනට සුදුසු වචන තෝරා ලියන්න.

තම ගවයාගේ කකුලේ වූ .................................... සුව කර ගැනීම සඳහා අවශ්‍ය ඖෂධ සෙවීමට ගොවියා ........................ට ගියේය. (වණය / වනය)

(2 x 20 = 40)

04 පහත සඳහන් ඡේදයේ හිස්තැනට සුදුසු වචන යොදා කථාව ගොඩනගන්න.

මාර්ගයේ සිට හෝර්ටන් තැන්න දක්වා දිවෙන පාර වංගු සහිත .................................. පාරකි. (පටු / පළල්) පාර දෙපැත්තේ ටර්පන්ටයින් ගස් ......................... වැවී තිබේ. (නිසරුවට / සරුවට) උදෑසන කාලයේ එහි පරිසරය ............................... (ළහිරු රැසින් / මීදුමින්) වැසී තිබේ. මාර්ගයේ සිට හෝර්ටන් තැන්නට ........................ (පැයකින් / පැය 5 කින්) ළඟාවීමට හැකි විය. හෝර්ටන් තැන්නේ පෙනෙන ............................... (මානයේ / පළල) තැනිතලා ප්‍රදේශයකි.

(1 x 5 = 05)

05 පහත වරහන් තුළ ඇති පෞද්ගලික ලිපියක අඩංගු කොටස් දී ඇති ආකෘතියේ ගැළපෙන තැන්වල ලියන්න.

(ආමන්ත්‍රණය / යවන්නාගේ නම / අඩංගු කරුණු / ආශිර්වාදය / ලිපිනය / දිනය)

(1) .................................................................

(2) .................................................................

(3) .................................................................

(4) .................................................................

(5) .................................................................

(6) .................................................................

(2 x 6 = 12)

06 ''මම වනයක සිටින පැණි කුරුල්ලෙක්'' යන මාතෘකාව යටතේ අර්ථවත් උක්ත ආඛ්‍යාතය නිවැරදි වැකි 4 ක් ලියන්න.

(1) ..........................................................................................................

(2) ..........................................................................................................

(3) ..........................................................................................................

(4) ..........................................................................................................

(2 x 4 = 08)

## 2015 - මධ්‍ය <$Ø ûÎæÂó× - 4 µÁó× - &'{Ù - û}õØ` ûõ×

01 (1) මැලේසියාව (2) මල්වාන (3) රතුපාටයි (4) 4 හෝ 5 ක්
(5) ලේනුන්, කුරුල්ලන් (6) ශිෂ්‍යයින් (7) අප්‍රසිද්ධ, අමු
(8) ගෙඩිය, ලේනා (9) මැලේසියාව, මල්වාන (10) කිරිල්ලියන්

02 (1) 2 (2) 1 (3) 3 (4) 2 (5) 1

03 (1) 1. අනේ ! 2. කෙසේ ද?
(2) 1. තරු අහසේ බබළයි 2. කුරුල්ලෝ මිහිරි ගිත ගයති
(3) 1. ශ්‍රී ලංකාවේ විශාලම වනාන්තරය සිංහරාජයයි.
2. උපාසිකාව මල් නෙළාගෙන පන්සල් ගියාය.
(4) 1. හැඳුවෙමු 2. ගෙනාවෝය (5) 1. හිරමනය 2. මිනී පෙට්ටිය
(6) 1. ම. ම. වි. 2. ලං. වි. ම. (7) 1. ද්‍රූපත 2. සිවුපාවෝ
(8) 1. එළදෙන 2. බල්ලා. මුවා. අශ්වයා
(9) 1. වඩු කර්මාන්තයේ දී 2. ධීවර කර්මාන්තයේ දී
(10) වණය / වනය

04 (1) පටු (2) සරුවට (3) මීදුමින් (4) පැයකින් (5) මානයේ

05 (1) ලිපිනය (2) දිනය (3) ආශිර්වාදය (4) ආමන්ත්‍රණය
(5) අඩංගු කරුණු (6) යවන්නාගේ නම

06 මාතෘකාවට අනුව උක්ත ආඛ්‍යාත සම්බන්ධය නිවැරදිව යොදා ඇත්නම් ලකුණු දෙන්න.